# ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

## ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

ඌව පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථාන |
|---|---|---|---|---|
| 01 | පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ අධිශ්‍රේණියේ නිලධාරියෙකු වීම | 01 | ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| සටහන:- අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට තනතුරට බඳවා ගැනීමට අදාල සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කරන සියලුම සහතික වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය | | | | |

**<u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>**

පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ අධිශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

I. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ අධිශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් පැවතීම.

III. අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05 ක කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමින් හෝ ඉන් ඔබ්බට ලගා කරගෙන තිබීම. හා එම වර්ෂ වලට අදාලව වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම

එමෙන්ම

IV. අයදුම්කරුගේ නායකත්වයෙන් යුතුව ලබාගත් ජාතික මට්ටමේ ජයග්‍රහණ තිබීම.

V. ක්ෂේත්‍රයට අදාලව පර්යේෂණ කෘතීන් ප්‍රසිද්ධ කර තිබීම.

VI. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් විෂයන් පිලිබඳව දේශිය හෝ විදේශ පුහුණු ආයතන මඟින් ලබා ඇති පුහුණු

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය | - | ලකුණු 40 |
| කුසලතාවය | - | ලකුණු 60 |

02. අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගත් ජීව දත්ත තොරතුරු ඇතුලත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානී හා අමාත්‍යාංශ ලේකම් මඟින්, අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමඟ 2020.03.02 වන දින හෝ එදිනට පෙර, "ඌව පළාත් ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ඌව පළාත් සභාව, බදුල්ල" යන ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතුය

03. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම හෝ මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ. මේ පිළිබඳව විස්තර කාර්යාල වේලාව තුළ දුරකථන අංක 055-2229426 ඇමතීමෙන් ලබා ගත හැකි වේ.

04. ඉහත සුදුසුකම් සපුරන නිලධාරීන්ගේ අයදුම්පත් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොලැබෙන්නේ නම් පහත සුදුසුකම් සම්පූර්ණ කරන ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

I. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. රෝහල් පරිපාලනය පිළිබඳව වසර තුනකට (03) නොඅඩු පළපුරුද්දක් තිබීම.

III. අංක 924/2 හා 1996.05.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ II වන පරිශිෂ්ටයේ සඳහන් පශ්චාත් උපාධි සහතිකයක් හෝ ඊට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.

පී.බී.විජයරත්න
ඌව පළාත් ප්‍රධාන ලේකම්